# අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10/11 ශ්‍රේණි සඳහා වීඩියෝ පාඩම් මාලාවට අදාළ ක්‍රියාකාරකම්**

**10 ශ්‍රේණිය - පරිච්ඡේදය 06 - ගනුදෙනුවල ද්විත්ව බලපෑම**

……………………………………………………………………………………...

**01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක i හා ii ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

සිදත් සමරසිංහ විසින් 2020.01.01 දින තමාගේ ඉතිරි කිරීමේ ගිණුමේ තිබූ රු. 200 000 ක මුදල යොදා සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. යෙදූ මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එදිනම රු. 100 000 ක බැංකු ණය මුදලක් ද ලබා ගන්නා ලදී.

2020.01.02 දින ව්‍යාපාරයේ පරිහරණය සඳහා රු. 80 000 ක ලී බඩු උපකරණ මිලදී ගත් අතර 2020.01.03 දින නැවත විකිණීමේ පරමාර්ථයෙන් රු. 160 000 ක භාණ්ඩ තොග ණයට ගන්නා ලදී.

2020.01.05 දින වෙළෙඳසැල පිහිටි ගොඩනැගිල්ලේ කුලිය සඳහා රු. 25 000 ක මුදලක් ගෙවූ අතර 2020.01.07 දින රු. 40 000 ක විකුණුම් ආදායමක් උපයා ගන්නා ලදී.

i. ඉහත සිද්ධියෙහි සඳහන් ගනුදෙනු 5ක් වටිනාකම් සහිත ව ලියා දක්වන්න.
ii. ඔබ ඉහත හඳුනා ගත් ගනුදෙනුවල ද්විත්ව බලපෑම වටිනාකම් සහිත ව ලියා දක්වන්න.

**02. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.**

(අ). ණයගැතියන්ගෙන් රු. 16 000 ක මුදල් ලැබීම ව්‍යාපාරයේ වත්කම් සඳහා පමණක් බලපෑම් ඇති කරන ගනුදෙනුවකි. ( )

(ආ). රු. 7 000 ක රක්ෂණ ගාස්තු ගෙවීම නිසා මුදල් වත්කම හා රක්ෂණ ගාස්තු වියදම රු. 7 000 බැගින් අඩු වේ. ( )

(ඉ). නැවත විකිණීම සඳහා රු. 20 000 ක භාණ්ඩ තොග අත්පිට මුදලට මිලදී ගැනීම නිසා බඩු තොග වත්කම රු. 20 000 කින් වැඩි වී මුදල් වත්කම රු. 20 000 කින් අඩු වේ. ( )

(ඊ). රු. 5 000 ක කොමිස් ආදායම් ලැබීම නිසා ප්‍රාග්ධන හිමිකම රු. 5 000 කින් වැඩි වී කොමිස් ආදායම රු. 5 000 කින් වැඩි වේ. ( )

**03. ද්විත්ව බලපෑම නිවැරදි ව යොදා හිස්තැන් පුරවන්න.**

i. අයිතිකරු විසින් රු. 800 000 ක් වටිනා මෝටර් රථයක් ව්‍යාපාරයට යෙදවීමෙන් මෝටර් රථ වත්කම රු. 800 000 කින් ………… වේ. ප්‍රාග්ධනය රු. 800 000 කින්……………..වේ.

ii. ණයහිමියන්ට රු. 60 000 ක් ගෙවීම නිසා ණයහිමි වගකීම රු. 60 000 කින් .................... වේ. මුදල් වත්කම රු. 60 000 කින් .................. වේ.

iii. රු. 12 000ක බැංකු ණය පොලී ගෙවීම නිසා බැංකු ණය පොලී වියදම රු. 12 000 කින් ............. වේ. මුදල් වත්කම රු. 12 000 කින් ..................වේ.

iv. ණයගැතියන්ගෙන් රු. 45 000 ක මුදල් ලැබීම නිසා මුදල් වත්කම රු. 45 000 කින් ..........වේ. ණයගැති වත්කම රු. 45 000 කින් .................. වේ.

**04.** **පහත වගුවෙහි සඳහන් කර ඇති ද්විත්ව බලපෑම්වලට අදාළ ගනුදෙනු වර්ිනාකම් සහිත ව ලියා දක්වන්න.**

| ගනුදෙනුව සිදු වූ දිනය | ගනුදෙනුවේ ද්විත්ව බලපෑම |
|---|---|
| 2019.10.02 | බඩු තොග වත්කම රු. 15 000 කින් වැඩි වීම<br>මුදල් වත්කම රු. 15 000 කින් අඩු වීම |
| 2019.10.03 | යන්ත්‍ර වත්කම රු. 25 000 කින් වැඩි වීම<br>මුදල් වත්කම රු. 25 000 කින් අඩු වීම |
| 2019.10.04 | ණයගැති වත්කම රු. 50 000 කින් වැඩි වීම<br>විකුණුම් ආදායම රු. 50 000 කින් වැඩි වීම |
| 2019.10.05 | ගැනිලි රු. 10 000 කින් වැඩි වීම<br>මුදල් වත්කම රු. 10 000 කින් අඩු වීම |

**05.** **නිවැරදි පිළිතුර තෝරන්න.**

1. රක්ෂණ ගාස්තු රු. 8 000 ක් ගෙවීම නිසා,

(1). රක්ෂණ ගාස්තු වියදම රු. 8 000 කින් අඩු වී මුදල් වත්කම රු. 8 000 කින් අඩු වේ.
(2). රක්ෂණ ගාස්තු වියදම රු. 8 000 කින් වැඩි වී මුදල් වත්කම රු. 8 000 කින් අඩු වේ.
(3). රක්ෂණ ගාස්තු වියදම රු. 8 000 කින් වැඩි වී මුදල් වත්කම රු. 8 000 කින් වැඩි වේ.
(4). රක්ෂණ ගාස්තු වියදම රු. 8 000 කින් අඩු වී මුදල් වත්කම රු. 8 000 කින් වැඩි වේ.

2. ව්‍යාපාරයේ පරිහරණය සඳහා රු. 1 000 000 ක ගොඩනැගිල්ලක් මිලදී ගැනීම නිසා,

(1). වත්කම් පමණක් වෙනස් වේ.
(2). වියදම් පමණක් වෙනස් වේ.
(3). හිමිකම පමණක් වෙනස් වේ.
(4). ආදායම් පමණක් වෙනස් වේ.

3. බැංකු ණය වාරිකය රු. 24 000 ක් ගෙවීම නිසා,

(1). බැංකු ණය වාරික වියදම රු. 24 000 කින් වැඩි වී මුදල් වත්කම රු. 24 000 කින් අඩු වේ.
(2). බැංකු ණය වාරික වියදම රු. 24 000 කින් අඩු වී මුදල් වත්කම රු. 24 000 කින් අඩු වේ.
(3). බැංකු ණය වගකීම රු. 24 000 කින් අඩු වී මුදල් වත්කම රු. 24 000 කින් අඩු වේ.
(4). බැංකු ණය වගකීම රු. 24 000 කින් අඩු වී මුදල් වත්කම රු. 24 000 කින් වැඩි වේ.

4. අයිතිකරු විසින් රු. 400 000 ක මුදලක් අමතර ප්‍රාග්ධනය ලෙස යෙදවීම නිසා,

(1). මුදල් වත්කම රු. 400 000 කින් වැඩි වී ප්‍රාග්ධනය රු. 400 000 කින් අඩු වේ.
(2). මුදල් වත්කම රු. 400 000 කින් වැඩි වී ප්‍රාග්ධනය රු. 400 000 කින් වැඩි වේ.
(3). මුදල් වත්කම රු. 400 000 කින් වැඩි වී අමතර ප්‍රාග්ධන ආදායම රු. 400 000 කින් වැඩි වේ.
(4). මුදල් වත්කම රු. 400 000 කින් වැඩි වී අමතර ප්‍රාග්ධන ආදායම රු. 400 000 කින් වැඩි වේ.

**06.** ඔබ ප්‍රදේශයේ ඇති සිල්ලර වෙළෙඳසැලක දිනක් තුළ සිදු වූ ගනුදෙනු සොයා බලා එම ගනුදෙනුවල ද්විත්ව බලපෑම හඳුනා ගන්න.